DOI : 10.31357/fhssmst.2013.00697

# ළමා ලිංගික අපයෝජනය පිළිබඳව

# සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

## (කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහල මැතිවරණ කොට්ඨාශයට අයත් මදුරාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඇසුරෙන්)

කේ. ලක්ෂිකා නදීශානි

20 MAR 2013

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ

ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා

සමාජ විද්‍යාව විෂය යටතේ ඉදිරිපත් කරන නිබන්ධය යි.

## උපාධි අපේක්ෂිකාවගේ ප්‍රකාශය

මෙම ශාස්ත්‍රීය නිබන්ධය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය එම්. ඩබ්ලිව්. ජයසුන්දර මහතාගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

අත්සන : Lakshika

නම : කේ. ලක්ෂිකා නදීශානි

දිනය : 20 . 03 . 2013

**සුපරීක්ෂක නිර්දේශය**

මෙම අපේක්ෂිකාව විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මෙම අපේක්ෂකයා විසින් "ළමා ලිංගික අපයෝජනය පිළිබඳව සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්" නම් පර්යේෂණ මාතෘකාව යටතේ 2013.01.21 දින පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ දී පවත්වන ලද වාචික පරීක්‍ෂණයෙන් පසුව පරීක්ෂකවරුන් විසින් පෙන්වා දී තිබූ සංශෝධනයන් සකස් කොට නියමිත පටිපාටියට අනුව ඉදිරිපත් කරන බවත්, ඒ සඳහා සුදුසු බවටත් නිර්දේශ කරමි.

අත්සන :

නම : මහාචාර්ය එම්. ඩබ්. ජයසුන්දර

සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ගංගොඩවිල

නුගේගොඩ

දිනය : 2013/03/20

# පටුන


| | පිටු අංකය |
|---|---|
| පටුන | i-vii |
| පිදුම | viii |
| උපකාරානුස්මෘතිය | ix |
| සාරාංශය | x, xi |

**පළමු පරිච්ඡේදය**

| | |
|---|---|
| **01. හැඳින්වීම හා ක්‍රම වේදය** | **1-15** |
| 1.1 හැඳින්වීම | 1-6 |
| 1.2 අධ්‍යයනයේ අරමුණු | 7 |
| 1.3 ක්‍රම වේදය හා මූලාශ්‍ර | 8-12 |
| 1.4 පර්යේෂණ සීමාව | 13 |
| 1.5 පර්යේෂිකාව මුහුණ දුන් ගැටළු | 14 , 15 |

**දෙවන පරිච්ඡේදය**

| | |
|---|---|
| **02. ළමා ලිංගික අපයෝජනය අර්ථ දැක්වීම** | **16-30** |
| 2.1 ළමයා පිළිබඳව අර්ථ දැක්වීම | 16-20 |
| 2.2 ළමා අපයෝජනය පිළිබඳව අර්ථ දැක්වීම | 21-26 |
| 2.3 ළමා ලිංගික අපයෝජනය පිළිබඳව අර්ථ දැක්වීම | 27-30 |

පිටු අංකය

**තෙවන පරිච්ඡේදය**

03. තෝරා ගත් රටවල් හා ශ්‍රී ලංකාවේ සිදුවන ළමා ලිංගික අපයෝජනය — 31-66

3.1 තෝරා ගත් රටවල් ඇසුරෙන් ළමා ලිංගික අපයෝජනය — 31-35

3.2 ශ්‍රී ලංකාවේ ළමා ලිංගික අපයෝජනය පිළිබඳ ඓතිහාසික පසුබිම — 36-38

3.3 ශ්‍රී ලංකාවේ සිදුවන ළමා ලිංගික අපයෝජනය — 39-48

3.4 ශ්‍රී ලංකාවේ සිදුවන ළමා ලිංගික අපයෝජන වැරදි — 49-66

**හතරවන පරිච්ඡේදය**

04. ශ්‍රී ලංකාවේ සිදුවන ළමා ලිංගික අපයෝජනයට හේතු හා බලපෑම් — 67-77

4.2 ශ්‍රී ලංකාවේ සිදුවන ළමා ලිංගික අපයෝජනයට හේතු — 67-73

4.3 ශ්‍රී ලංකාවේ සිදුවන ළමා ලිංගික අපයෝජනයට ගොදුරු වූ ළමයින් විෂයෙහි බලපාන බලපෑම් — 74-77

**පස්වන පරිච්ඡේදය**

05. අධ්‍යයන ක්ෂේත්‍රය හැඳින්වීම, දත්ත සකස් කිරීම හා විශ්ලේෂණය — 78-124

5.1 අධ්‍යයන ක්ෂේත්‍රය හැඳින්වීම — 78-86

5.2 ලිංගික අපයෝජනයට ගොදුරු වූ ළමයින් පිළිබඳ ප්‍රත්‍යයෙක අධ්‍යයනය — 87-106

5.3 දත්ත සකස් කිරීම හා විශ්ලේෂණය — 107-124

පිටු අංකය

**හය වන පරිච්ඡේදය**

**06. නිගමන හා යෝජනා** **125-133**

6.1. නිගමන 125-129

6.2. යෝජනා 130-133

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය** **134-137**

**උප ග්‍රන්ථය**

1. සිතියම් i,ii

2. ඡායාරූපාවලිය iii-ix

## වගු නාමාවලිය


| | | පිටු අංකය |
|---|---|---|
| 01 වගුව | ශ්‍රී ලංකාවේ සිදුවන ළමා ලිංගික අපයෝජනය | 40 |
| 02 වගුව | ස්ත්‍රී /පුරුෂ භාවය අනුව ලිංගික අපයෝජනයට ගොදුරු වී ඇති ළමයි සංඛ්‍යාව | 44 |
| 03 වගුව | ශ්‍රී ලංකාවේ සමාජ පන්ති අතර සිදුවන ළමා ලිංගික අපයෝජනය (2004) | 45 |
| 04 වගුව | වයස් මට්ටම අනුව ශ්‍රී ලංකාවේ සිදුවන ළමා ලිංගික අපයෝජනය (2001) | 45 |
| 05 වගුව | වයස් මට්ටම් අනුව ලිංගික අපයෝජනයට ගොදුරු වී ඇති ළමයි සංඛ්‍යාව | 46 |
| 06 වගුව | ලිංගික අපයෝජනය සිදු කළ පුද්ගලයන් | 47 |
| 07 වගුව | මදුරාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජනගහණය (2010) | 80 |
| 08 වගුව | මදුරාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වයස් කාණ්ඩ අනුව ජනගහන ව්‍යාප්තිය (2010) | 81 |
| 09 වගුව | මදුරාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජාතීන් අනුව ජනගහණ ව්‍යාප්තිය (2010) | 81 |
| 10 වගුව | මදුරාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රැකියා මට්ටම් අනුව ජනගහණ ව්‍යාප්තිය (2010) | 82 |
| 11 වගුව | මදුරාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අධ්‍යාපන මට්ටම් අනුව ජනගහණ ව්‍යාප්තිය (2010) | 84 |

**පිටු අංකය**


| | | |
|---|---|---|
| 12 වගුව | මදුරාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ආගම් අනුව ජනගහණ ව්‍යාප්තිය (2010) | 85 |
| 13 වගුව | මදුරාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සිදුවන ළමා ලිංගික අපයෝජන ක්‍රියා (2010) | 86 |
| 14 වගුව | වාර්ගිකත්වය හා ආගම අනුව ලිංගික අපයෝජනයට ගොදුරු වූ ළමයින් සංඛ්‍යාව | 107 |
| 15 වගුව | ලිංගිකත්වය අනුව ලිංගික අපයෝජනයට ගොදුරු වූ ළමයින් සංඛ්‍යාව | 108 |
| 16 වගුව | වයස් මට්ටම අනුව ලිංගික අපයෝජනයට ගොදුරු වූ ළමයින් සංඛ්‍යාව | 108 |
| 17 වගුව | අධ්‍යාපන මට්ටම අනුව ලිංගික අපයෝජනයට ගොදුරු වූ ළමයි සංඛ්‍යාව | 109 |
| 18 වගුව | අපයෝජනයේ ස්වභාවය අනුව ලිංගික අපයෝජනයට ගොදුරු වූ ළමයි සංඛ්‍යාව | 110 |
| 19 වගුව | ලිංගික අපයෝජනයට ගොදුරු වූ දවස අනුව ළමයි සංඛ්‍යාව | 111 |
| 20 වගුව | ලිංගික අපයෝජනයට ගොදුරු වූ වේලාව අනුව ළමයි සංඛ්‍යාව | 112 |
| 21 වගුව | ලිංගික අපයෝජනයට ගොදුරු වූ කාල සීමාව අනුව ළමයි සංඛ්‍යාව | 112 |
| 22 වගුව | ලිංගික අපයෝජනයට ගොදුරු වුයේ කැමැත්තෙන්ද හා බලහත් කාරයෙන් ද යන වග අනුව ලිංගික අපයෝජනයට ගොදුරු වූ ළමයි සංඛ්‍යාව | 113 |

පිටු අංකය


| | | |
|---|---|---|
| 23 වගුව | අතවරයට පත් වූ ළමයා හා අපයෝජකයා අතර සම්බන්ධය අනුව ලිංගික අපයෝජනයට ගොදුරු වූ ළමයි සංඛ්‍යාව | 114 |
| 24 වගුව | ලිංගික අපයෝජනයට ගොදුරු වූ ස්ථානය අනුව ළමයි සංඛ්‍යාව | 115 |
| 25 වගුව | දෙමාපියන්ගේ ජීවන වෘත්තීන් | 116 |
| 26 වගුව | දෙමාපියන්ගේ රැකියා නියුක්තිය | 117 |
| 27 වගුව | ලිංගික අපයෝජනයට ගොදුරු වූ ළමයින්ගේ පවුල්වල මාසික ආදායම් මට්ටම | 118 |
| 28 වගුව | මව්වරුන්ගේ හා පියවරුන්ගේ අධ්‍යාපන මට්ටම | 119 |
| 29 වගුව | ළමයින් ලිංගික අපයෝජනයට ගොදුරු වීමට හේතු වූ ළමයින්ගේ ක්‍රියා කලාපය | 120 |
| 30 වගුව | ළමයින් ලිංගික අපයෝජනයට ගොදුරු වීමට හේතු වූ දෙමාපියන්ගේ ක්‍රියා කලාපය | 121 |
| 31 වගුව | ළමයින් ලිංගික අපයෝජනයට ගොදුරු වීමෙන් සිදු වී ඇති බලපෑම් | 123 |

## ප්‍රත්‍යයෙක අධ්‍යයන


| | | පිටු අංකය |
|---|---|---|
| 01 | ප්‍රත්‍යයෙක අධ්‍යයනය - ගයනි (A) | 87 - 89 |
| 02 | ප්‍රත්‍යයෙක අධ්‍යයනය - දයානි (B) | 89 , 90 |
| 03 | ප්‍රත්‍යයෙක අධ්‍යයනය - රසිකා (C) | 91 , 92 |
| 04 | ප්‍රත්‍යයෙක අධ්‍යයනය - නිලූකා (D) | 93 , 94 |
| 05 | ප්‍රත්‍යයෙක අධ්‍යයනය - ක්‍රිෂ්ණා (E) | 95 , 96 |
| 06 | ප්‍රත්‍යයෙක අධ්‍යයනය - තමරා (F) | 97 - 99 |
| 07 | ප්‍රත්‍යයෙක අධ්‍යයනය - හිමාලි (G) | 99 - 101 |
| 08 | ප්‍රත්‍යයෙක අධ්‍යයනය - නිශාදි (H) | 101 , 102 |
| 09 | ප්‍රත්‍යයෙක අධ්‍යයනය - මදූෂ (I) | 103 , 104 |
| 10 | ප්‍රත්‍යයෙක අධ්‍යයනය - නුවන් (J) | 104 - 106 |

## පිදුම

ඉමක් නොපෙනෙන නීල නිලඹර
පුරා පැතිරුනු අඳුර දියකර .......
උදාගිර මත හිඳ සිනාසෙන
අරුණ කැන්දන , තිමිර බිඳලන
දිනිසුරුන් වූයේ නුඹයි .......
ආදරණීය මවුනි , පියාණනි,
පාළු නිරුදක මහා කතරක
හුදකලා වූ නීල නෙත යුග
නිවා සනහා සුව විදාහල
නිල්ල දිලෙනා කෙම් බිමක්
තැනුවේ නුඹයි .......
දයාබර ඇඳුරුතුමනි,
ඉදින් පුදන්නම් .......
බුද්ධියේ ප්‍රභාතයෙන්
ඒකාලෝක වූ මේ... නිබන්ධය
බැති සිතින් දෙපා නැමැද .......

# උපකාරානුස්මෘතිය

නිබන්ධයේ සැළසුම් සකස් කිරීමේ සිට නිබන්ධය අවසන් කර එය ඉදිරිපත් කිරීම දක්වා තම වටිනා කාලය ශ්‍රමය කැපකරමින් නිබඳව මාර්ගෝපදේශකත්වය ලබා දුන් මහාචාර්ය එම්. ඩබ්. ජයසුන්දර මහතා ට

නිබන්ධ මාතෘකාව අනුමත කිරීමේ සිට නිබන්ධය භාර දීම දක්වා සහය ලබා දුන් පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපති තුමා ඇතුළු සියළුම කාර්ය මණ්ඩලයට

මෙම අධ්‍යයනය සඳහා තොරතුරු ලබා දුන් මදුරාවල ප්‍රදේශයේ ලිංගික අපයෝජනයට ගොදුරු වූ ළමයින් හා එම ළමයින්ගේ දෙමාපියන්ට

මෙම අධ්‍යයනය සඳහා තොරතුරු ලබා ගැනීමට සහය දුන් අඟුරුවාතොට පොලිසියේ ස්ථානාධිපතිට

මෙම නිබන්ධයේ විවිධ වූ කාර්යන් සඳහා සහය ලබා දුන් විවෘත විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ටී. ඒ. වික්‍රමසිංහ මහත්මිය, විජේවන්ත මහතාට, නිශාන්ත, මහින්ද, කිත්සිරි හා සමීර සොහොයුරන්ට

මෙම අධ්‍යයනය සිදු කිරීම සඳහා නිබඳව ශක්තියක් වූ ආදරණීය අම්මා, තාත්තා, පොඩි මල්ලී ලොකු මල්ලී හා ධම්මික අයියාට

මාගේ හෘදයාංගම ස්තුතිය බැති සිතින් පුද කරමි.

# සාරාංශය

රටක ජීවනාලිය ළමා පරපුරයි. ළමයින් රැක ගැනීම මුළු මහත් සමාජයේම වගකීමකි. මව්පියන්ට තම දරුවන් තරම් වටිනා සම්පතක් නොමැත. එබැවින් දෙමාපියන් තම දරුවන්ව දෙනෙත් සේ රැක බලා ගනිති. එහෙත් ළමා පරපුර විවිධ වූ අපයෝජන ක්‍රියාවන්ට ගොදුරු වන බව වර්තමාන සමාජයේ හඳුනා ගත හැකිය. ලෝකය පුරා සිදුවන ළමා අපයෝජන ක්‍රියා අතරින් ශ්‍රී ලංකාවේ ළමයින්ට එරෙහිව සිදුවන ලිංගික අපයෝජනය බරපතලම ගැටළුවක් බවට පත් වී ඇත. (වන්නි ආරච්චි 2003, පිඃ 154)

මෙම නිබන්ධයෙන් ළමයා යනු කවරෙක්දැයි අර්ථ විග්‍රහ, ළමා අපයෝජනය පිළිබඳව අර්ථ විග්‍රහ, ළමා ලිංගික අපයෝජනය පිළිබඳව අර්ථ විග්‍රහ, තෝරා ගත් රටවල් ඇසුරෙන් ළමා ලිංගික අපයෝජනය පිළිබඳව, ශ්‍රී ලංකාවේ ළමා ලිංගික අපයෝජනය පිළිබඳ ඓතිහාසික පසුබිම, ශ්‍රී ලංකාවේ සිදුවන ළමා ලිංගික අපයෝජනය පිළිබඳව, ශ්‍රී ලංකාවේ සිදුවන ළමා ලිංගික අපයෝජන වැරදි, ශ්‍රී ලංකාවේ සිදුවන ළමා ලිංගික අපයෝජනයට හේතු හා ශ්‍රී ලංකාවේ සිදුවන ළමා ලිංගික අපයෝජනයට ගොදුරු වූ ළමයින් විෂයෙහි බලපාන බලපෑම් පිළිබඳව සාහිත්‍ය විමර්ශනයනයක් නිර්මිතය.

එසේම නිබන්ධයේ බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පිහිටි බුලත්සිංහල මැතිවරණ කොට්ඨාශයට අයත් මදුරාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි වර්ෂ 2005-2009 දක්වා ලිංගික අපයෝජනයට ගොදුරු වූ අවුරුදු 8-18 දක්වා වයසැති ග්‍රාමීය ගැහැණු හා පිරිමි ළමයි 10 දෙනෙක් පරමාර්ථගත නියදි ක්‍රමය යටතේ තෝරා ගෙන එම ළමයින් සමඟ රැපෝවක්, සමීපත්වයක් හා විශ්වසනීයත්වයක් ගොඩ නගා ගැනීමෙන් ප්‍රත්‍යයෙක අධ්‍යයන ක්‍රමය යොදා ගෙන අනාකෘතිමය සම්මුඛ සාකච්ඡා ක්‍රමය මගින් කැමත්තෙන් පමණක් බැලපෑමකින් තොරව දත්ත ලබා ගෙන එම ළමයි අතවරයට පත් වූ ආකාරය, එම ළමයින්ගේ පසුබිම, ලිංගික අපයෝජනයට ගොදුරු වීමට හේතු, ලිංගික අපයෝජනයට ගොදුරු වීමෙන් එම ළමයින්ට සිදු වී ඇති බලපෑම් ආදිය පිළිබඳව සමාජ විද්‍යාත්මකව විශ්ලේෂණය කර තිබේ.

එසේම මෙම අධ්‍යයනයෙන් ලිංගික අපයෝජනයට ගොදුරු වූ ළමයින්ගේ පසුබිම එකිනෙකා අතර වෙනස්කම් පවතින බව, ළමයින්ගේ හා දෙමාච්පියන්ගේ පසුබිම ලිංගික අපයෝජනයට ගොදුරු වීම සඳහා බලපා ඇති බව, ළමයින් ලිංගික අපයෝජනයට ගොදුරු

වීමට විවිධ හේතු සාධක බලපා ඇති බව හා ළමයින් ලිංගික අපයෝජනයට ගොදුරු වීමෙන් විවිධ වූ බලපෑම වලට මුහුණදී ඇති බව නිගමනය කළ හැකි විය.

එලෙසම මෙම නිබන්ධයෙහි පහත ආකාරයට පරිච්ඡේදකරණය දක්වා ඇත. මෙම පර්යේෂණ නිබන්ධයේ ප්‍රථමයෙන්ම පිදුම, උපකාරානුස්මෘතිය, සාරාංශය හා පටුනකින් සමන්විත ය.

මෙම නිබන්ධයේ පළමු පරිච්ඡේදයෙන් හැඳින්වීම හා ක්‍රම වේදය දක්වා තිබේ. එහිදී ප්‍රථමයෙන් පර්යේෂණයේ හැඳින්වීම දක්වා ඇති අතර ඉන් අනතුරුව අධ්‍යයනයේ අරමුණු, ක්‍රම වේදය, මූලාශ්‍ර, පර්යේෂණ සීමාව හා පර්යේෂිකාව මුහුණ දුන් ගැටළු සඳහන් කර ඇත.

මෙම නිබන්ධයේ දෙවන පරිච්ඡේදයෙන් ළමා ලිංගික අපයෝජනය පිළිබඳව අර්ථ දක්වා තිබේ. එහිදී ප්‍රවේශයක් ලෙස ළමයා පිළිබඳව හා ළමා අපයෝජනය පිළිබඳව අර්ථ දක්වා ඇති අතර ඉන් අනතුරුව ළමා ලිංගික අපයෝජනය පිළිබඳව අර්ථ දක්වා ඇත.

මෙම නිබන්ධයේ තෙවන පරිච්ඡේදයෙන් ශ්‍රී ලංකාවේ සිදුවන ළමා ලිංගික අපයෝජනය පිළිබඳව සඳහන් කර තිබේ. එහිදී ප්‍රවේශයක් ලෙස ප්‍රථමයෙන් තෝරා ගත් රටවල් ඇසුරෙන් ළමා ලිංගික අපයෝජනය හා ශ්‍රී ලංකාවේ ළමා ලිංගික අපයෝජනය පිළිබඳ ඓතිහාසික පසුබිම සාකච්ඡා කර ඇති අතර ඉන් පසුව ශ්‍රී ලංකාවේ සිදුවන ළමා ලිංගික අපයෝජන වැරදි පිළිබඳ නිර්මිත ය.

මෙම නිබන්ධයේ සිව්වන පරිච්ඡේදයෙන් ශ්‍රී ලංකාවේ සිදුවන ළමා ලිංගික අපයෝජනයට හේතු හා ශ්‍රී ලංකාවේ සිදුවන ළමා ලිංගික අපයෝජනයට ගොදුරු වූ ළමයින් විෂයෙහි බලපාන බලපෑම් පිළිබඳව සාකච්ඡා කර තිබේ.

මෙම නිබන්ධයේ පස්වන පරිච්ඡේදයෙන් අධ්‍යයන ක්ෂේත්‍රය හැඳින්වීම, දත්ත සකස් කිරීම හා විශ්ලේෂණය සිදු කර තිබේ. එහිදී දත්ත සකස් කිරීම හා විශ්ලේෂණය ට ප්‍රවේශයක් ලෙස අධ්‍යයන ක්ෂේත්‍රය හඳුන්වා තිබේ. ඉන් පසුව ලිංගික අපයෝජනයට ගොදුරු වූ ළමයින් පිළිබඳ ප්‍රත්‍යයෙක අධ්‍යයනය සාකච්ඡා කර දත්ත සකස් කර විශ්ලේෂණය කර ඇත.

මෙම නිබන්ධයේ හයවන පරිච්ඡේදයෙන් අධ්‍යයනයෙහි නිගමන හා යෝජනා පිළිබඳව නිර්මිතය. එසේම නිබන්ධයෙහි අවසානයේ ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලියකින් හා උප ග්‍රන්ථයකින් (සිතියම් 1, සිතියම් 2, ප්‍රශ්නාවලිය හා ඡායාරූපාවලිය) සමන්විත ය.

# පළමු පරිච්ඡේදය

## 01. **හැඳින්වීම හා ක්‍රම වේදය**

### 1.1 **හැඳින්වීම**

ළමා පරපුර සමාජයක අගනාම සම්පත බව අවිවාදයෙන් පිළිගත යුත්තකි. ඈත අතීතයේ සිටම ළමයින් ලිංගික වශයෙන් අපයෝජනයට ගොදුරුවීම සිදු වී ඇත. ශ්‍රී ලංකාවේ සමාජ ධර්මතා ගිලිහී ගොස් මුදල් පසු පස හඹා යන සමාජයක ළමයින් ලිංගික වශයෙන් අපයෝජනයට ගොදුරු වීම අරුමයක් නොවිය හැක. ළමයින් ලිංගික අපයෝජනයට ගොදුරුවීම හුදෙක් එම ළමයින්ට, එම ළමයින්ගේ දෙමාපියන් හා පවුලේ සාමාජිකයන් පමණක් නොව සමස්ත සමාජයටම බලපාන සමාජමය ගැටලුවකි.

මෙහිදී ළමයා යනු කවරෙක් ද හා ළමා අපයෝජනය යනු කුමක්දැයි මූලික වශයෙන් හඳුනා ගැනීම වැදගත් වේ. ළදරු වයසේ අහිංසකත්වයත් වැඩිහිටි වයසේ අභිමානයත් අතර අපට දක්නට ලැබෙන්නේ ළමයා යනුවෙන් හඳුන්වනු ලබන අපූරු නිර්මාණය යි.

ළමා අයිතිවාසිකම් පිළිබඳව දක්වා ඇති 1989 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සම්මත කරගත් **ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ** *(Convention of the Right of Child)* 1 වන වගන්තියේ ළමයෙක් යනු කවරෙක්ද? යන්න අර්ථ දක්වා තිබේ. එනම්, ළමයෙකු යනුවෙන්, එම ළමයාට අදාළ නීතිය යටතේ **වයස අවුරුදු 18ට පෙර ඔහු වයස් පූර්ණත්වය ලබන්නේ නම් මිස වයස අවුරුදු 18ට අඩු සෑම මනුෂ්‍යයකුම ළමයෙකු ලෙස** අදහස් වේ. මේ අනුව **අවුරුදු 18ට අඩු** සෑම මනුෂ්‍යයකුම ළමයෙක් ලෙස අර්ථ දක්වා ඇත. (**ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය** 1989, 1993, පිඃ 02)

ළමා අපයෝජනය යන්න ලෝකයේ මෙන්ම ශ්‍රී ලාංකික ජන සමාජය තුළ පැන නැගී ඇති සංකීර්ණ සමාජ ගැටළුවකි. (පෙරේරා, 2005, පිඃ 35) **ළමයින්ට එරෙහිව සිදු කරනු ලබන විවිධාකාරයේ අපරාධ හෝ වැරදි නොසලකා හැරීම සහ ළමයින්ගේ අයිතිවාසිකම් උල්ලංඝණය වන කවර හෝ ආකාරයේ ක්‍රියාවක්** ළමා අපයෝජනය ලෙස සරලව හැඳින්විය හැකිය.

ළමා අපයෝජනය යනුවෙන් අදහස් කරන්නේ **"ළමයාගේ සෞඛ්‍යයට සහ වර්ධනයට ඇත්ත වශයෙන්ම හානිකර හෝ හානිකර වීමට මග සලසන සහ ළමයා වේදනාවන් වලට ලක්**